## ප්‍රවාහන, බෙදා හැරීම් සහ සැපයුම් ක්ෂේත්‍රය
## (Transpotaion, Distribution and Logistion Sector)

ප්‍රවාහනය, බෙදාහැරීම සහ සැපයුම් ක්ෂේත්‍රයේ පුද්ගලයන් මාර්ග, ගුවන්, දුම්රිය සහ ජලය මගින් මිනිසුන් සහ නිෂ්පාදන ප්‍රවාහනය කරයි. ඔබට මෙම ක්ෂේත්‍රය තුළ රියදුරෙකු, ගුවන් නියමුවෙකු, ඉංජිනේරුවෙකු හෝ කපිතාන්වරයෙකු ලෙස වැඩ කළ හැකි ය.

ඔබට මිනිසුන් සහ නිෂ්පාදන ගෙන යන වාහන, දුමරිය, ගුවන් යානා සහ නැව් අලුත්වැඩියා කිරිමට හෝ නඩත්තු කිරීමට හැකි ය. එසේත් නැති නම් නිෂ්පාදන සහ පුද්ගලයින් නියමිත වේලාවට නියමිත පැමිණීම පරීක්ෂා කිරීම වැනි කාර්යයන්වල ද නියැළිය හැකි ය.

**ප්‍රවාහන, බෙදා හැරීම් සහ සැපයුම් ක්ෂේත්‍රයේ රැකියා/ වෘත්ති,**

**1. ගුවන් ගමනාගමන පාලක (Air Trafic controller)**
ගුවන් ගමනාගමනය පාලනය කිරිම, ගුවන් නියමුවන්ට ගුවන්ගත කිරීම සහ ගොඩබෑම සඳහා අවසර දීම සිදු කරයි.

**2. ගුවන් යානා භාණ්ඩ හැසිරවීමේ අධීක්ෂක (Aircreft Cargo Handing Supervisor)**
ගුවන්යානා භාණ්ඩ හෝ ගමන්මලු පැටවීම සහ බෑමේ දී ගුවන් තොටුපල භූමී කාර්ය මණ්ඩල අධික්ෂණ කටයුතු සිදු කිරිම.

**3 ගුවන්යානා යාන්ත්‍රික හා සේවා කාර්මික (Aircraft Mechanic and Service Technician)**
ගුවන්යානා එන්ජින් සහ අනෙකුත් පද්ධති අලුත්වැඩියා කිරීම.

**4. ගුවන් තොටුපල මෙහෙයුම් විශේෂඥ (Airfield Operations Specialist)**
ගුවන් ගමන් ආරක්ෂිතව ගුවන් ගත කිරීමට සහ ගොඩබෑමට වග බලා ගැනිම.

**5. ගුවන් නියමු (Airline Piolt)**
නියමිත මාර්ගවල ගුවන් යානා හෝ හෙලිකොප්ටර පියාසර කරවීම.

**6. ගිලන් රථ රියදුරු සහ සහායක (Ambulance Drivers and Attendanit)**
ගිලන් රථ ධාවනය කර අසනිප හෝ තුවාල වූ පුද්ගලයින් ප්‍රවාහනය කිරීමට උදව් කරන්නා.

**7. වාහන කොටස් අලුත්වැඩියා කරන්නා (Automotive Boday Repairees)**
මෝටර් රථ රාමුවල කොටස් ප්‍රතිසාධනය කර ප්‍රතිස්ථාපනය කිරිම.

**8. මෝටර් රථ සේවා කාර්මික (Automative Srvice Technician)**
ගැටලු හඳුනා ගෙන කාර් සහ සැහැල්ලු ට්‍රක් රථ අලුත්වැඩියා සිදු කිරිම.

**9. ගුවන් තාක්ෂණ ශිල්පි (Avionics Technician)**
ගුවන්යානා ඉලෙක්ට්‍රොනික උපකරණ ස්ථාපනය හා පරික්ෂා කිරීම.

**10. බයිසිකල් අලුත්වැඩියා කරන්නා**
බයිසිකල් අලුත්වැඩියා කිරීම සහ සේවා සැපයීම.

**11. බිල්පත් හා තැපැල් ලිපිකරු**
බිල්පත් අරමුණු සඳහා තොරතුරු සම්පාදනය කර වාර්තා කරන්නා.

**12. රථවාහන කාර්මික**
බස්, ට්‍රක් රථ ආදි ඕනෑම රථයක් නඩත්තු කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

**13. ජල යාත්‍රාවල කපිතාන්, සහකරුවන් සහ නියමුවන් (Captain, Mates and Piolt of water Vessels)**
නැව් සහ අනෙකුත් ජල යාත්‍රාවල මෙහෙයුම් අධික්ෂණය කිරිම.

**14. භාණ්ඩ හා භාණ්ඩ ප්‍රවාහන නියෝජිත (Cargo and freigt agent)**
ගුවන් සේවා දුම්රිය සහ ට්‍රක් රථ පර්යන්ත සහ නැව් තටාක හරහා විවිධ ද්‍රව්‍ය නැව්ගත කිරීම.

**15. වාණිජ ගුවන් නියමු (Commercial Pilot)**
නියමිත නොවන මාර්ගවල ගුවන් යානා හෝ හෙලිකොප්ටර් පියාසර කරන්නා.

**16. කුරියර් සහ පණිවිඩකරු (Couier and Massanger)**
පණිවිඩ, ලේඛන හෝ පැකේජ ලබා ගන්න හෝ භාර දෙන්නා.

**17. ප්‍රවාහන උපකරණවල විදුලි හා ඉලෙක්ට්‍රොනික ස්ථාපකයන් සහ අලුත්වැඩියා කරන්නා**
ජංගම ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපකරණ ස්ථාපනය කිරිම හෝ නඩත්තු කිරිම.

**18. ගුවන් සේවිකා (Flight Attendent)**
ගුවන් ගමන් අතරතුර ගුවන් මගින් සැපපහසුව සහ ආරක්ෂිත බව සහතික කිරීමට පුද්ගලික සේවා සපයන්නා.

**19. භාණ්ඩ ප්‍රවාහන හා කොටස් කම්කරු**
භාණ්ඩ ප්‍රවාහනය තොග හෝ වෙනත් ද්‍රව්‍ය අතින් ගෙන යන්නා.

**20. බර සහ ට්‍රැක්ටර් ට්‍රෙලර් ට්‍රක් රථ රියදුරු**
ට්‍රැක්ටර්, ට්‍රෙලර්, ට්‍රක් රථ වැනි බර වාහන මගින් භාණ්ඩ ප්‍රවාහනය සිදු කිරිම.

**21. ලෙකොමෝටිව් ෆයර්ස් (Locomotive Firers)**
දුම්රිය උපකරණ නරඹන්නා සහ දුමරිය මාර්ගවල ඇති බාධක ගැන විමසිල්ලෙන් සිටින්නා.

**22. බර වාහන උපකරණ කාර්මික**
දොඹකර, බුල්ඩෝසර් වැනි ඉතා විශාල වාහන අලුත්වැඩියා කිරිම සහ නඩත්තු කිරිම.

**23. මෝටර් වාහන ඉලෙක්ට්‍රොනික උපකරණ ස්ථාපකයන් සහ අලුත්වැඩියා කරන්නා**
මෝටර් රථවල සන්නිවේදන උපකරණ ස්ථාපනය කිරීම සහ අලුත්වැඩියා කිරීම.

**24. මෝටර් බොට්ටු යන්ත්‍ර කාර්මික**

බෝට්ටු එන්ජින්වල යාන්ත්‍රික හා විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම.

**25. මෝටර් බෝට්ටු ක්‍රියාකරු**
කුඩා මොටරයෙන් ධාවනය වන බෝට්ටු ක්‍රියාත්මක කිරිම.

**26. යතුරු පැදි කාර්මික**
යතුරු පැදි එකලස් කිරිම හා අලුත්වැඩියා කිරීම.

**27. රේල් පිළි තැබීම සහ නඩත්තු උපකරණ ක්‍රියාකරු**
දුම්රිය මාර්ග තැබිම, අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම.

**28. දුම්රිය තිරංග, සංඥා සහ ස්විච් ක්‍රියාකරු**
දුම්රිය මාර්ග ස්විච ක්‍රියාත්මක කරවිම.

**29. කුලි රථ රියදුරු**
මගීන් ප්‍රවාහනය කිරිම සඳහා විවිධ වාහන භාවිත කිරීම.

**30. රථවාහන කාර්මික ශිල්පි**
රථවාහන තත්ත්වයට බලපාන සාධක නිරීක්ෂණය කිරිම සඳහා ක්ෂෙත්‍ර අධ්‍යනය කටයුතු සිදු කිරීම.